## කොළඹ විශ්වවිද්‍යාලයීය
## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාවට
## අයදුම්පත් භාර ගැනීමේ දිනය දෙසැම්බර් 15 දක්වා දීර්ඝ කෙරේ.

කොළඹ විශ්වවිද්‍යාලයේ සන්නිවේදනය හා නිර්මාණාත්මක කලා අධ්‍යයනාංශය මෙහෙයවන සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ ව 2024 අධ්‍යයන වර්ෂය සඳහා මේ දිනවල අයදුම්පත් කැඳවනු ලැබේ. වෘත්තීය පාඨමාලාවක් වශයෙන් ජාතික වෘත්තීය සුදුසුකම් ස්තරයෙහි පස්වන කාණ්ඩයට (NVQ Level 05) අයත් 'සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය' ඩිප්ලෝමා පාඨමාලාව ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ තෙවන ස්තරයට (SLQF Level 03) අයත් පාඨමාලාවක් වශයෙන් යාවත්කාලීන කර ඇත. ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ රැකියාවල නියුක්ත හා අදාළ සේවා පළපුරුද්ද ඇති මාධ්‍යවේදීන්ට මේ සඳහා අයදුම් කළ හැකි ය. මීට අමතරව, නිදහස් මාධ්‍යවේදීහු ද දැනට ලේඛන කටයුතුවල නියුක්ත සාහිත්‍යවේදීහු ද ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ නිර්මාණ ශිල්පීහු ද මෙම පාඨමාලාවට අයදුම් කිරීමට සුදුසුකම් ලබති.  එමෙන්ම, ජනමාධ්‍ය ක්ෂේත්‍රයට පිවිසීමට අපේක්ෂා කරන, දැනට ජනමාධ්‍ය ක්‍රියාකාරකම්වල නියුක්ත ප්‍රමාණවත් සුදුසුකම් සහිත ආධුනිකයන් සීමිත සංඛ්‍යාවක් ද පාඨමාලාවට ඇතුළත් කරගැනෙන බැවින් ඔවුන්ට ද සිය අයදුම්පත් යොමු කළ හැකි ය.

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන් ම මෙම පාඨමාලාව පැවත්වෙන අතර සිසුන් බඳවා ගැනෙන්නේ සම්මුඛ පරීක්ෂණයක් මගිනි. මෙම සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලව සඳහා වූ අයදුම්පත් විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය හා ප්‍රකාශන අංශයෙන් ද www.cmb.ac.lk වෙබ් අඩවියෙන් ද ලබා ගත හැකි ය. මේ පිළිබඳව වැඩි විස්තර 0112500431 යන දුරකථන අංකය ඇමතීමෙන් ලබාගත හැකි ය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2023 දෙසැම්බර් මස 15 වැනිදා ය.